27.07.2016

# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2016
# ඉතිහාසය

විභාග අංකයා: ..................................

| 11 ශ්‍රේණිය | I පත්‍රය | කාලය පැය 01 යි. |
|---|---|---|

උපදෙස්

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී වඩා විශ්වාසනීය හා අඛණ්ඩ ලිඛිත ඉතිහාසය ලියවී ඇති කෘතිය ලෙස සැළකෙන්නේ,
(1) රාජාවලියයි. (2) දීපවංසයයි.
(3) මහා වංසයයි. (4) බෝධි වංසයයි.

02. රටක ඉතිහාසය හැදෑරීමේ දී එම රටේ ආර්ථික තත්වය, වෙළඳාම, ලෝහ භාවිතය සම්බන්ධ වඩාත් නිවැරදි තොරතුරු ලබා ගත හැක්කේ එම රටේ,
(1) නටඹුන් පරීක්ෂා කිරීමෙනි. (2) කාසි භාවිතය පරීක්ෂා කිරීමෙනි.
(3) සෙල්ලිපි තොරතුරු පරීක්ෂා කිරීමෙනි. (4) මූර්ති හා පුරාවස්තු පරීක්ෂා කිරීමෙනි.

03. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යාප්තිය පරිසර කලාප 08 කට වෙන්වී තිබේ. පරිසර කලාප තීරණය කිරීමේ දී ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගනු ලබන්නේ,
(1) වාර්ෂික වර්ෂාපතන රටාව ය. (2) භූමියේ විෂමතාවය ය.
(3) වන සතුන්ගේ ගහනය ය. (4) වෘක්ෂලතාවල ව්‍යාප්තිය ය.

04. මෙරට ගල් යුගයේ විසූ මානවයින්, කෙනෙකු මිය ගිය විට අවමංගල්‍ය චාරිත්‍ර පවත්වා ඇත. ඒ අනුව මිනිස් ඇට සැකිලි නවා වකුටු කොට වළලා තිබූ බවට සාක්ෂි හමු වී ඇත්තේ,
(1) රංචාමඩම සුසාන භූමියෙනි. (2) රාවණා ඇල්ල ගල් ගුහාවෙනි.
(3) පාහියන්ගල ලෙනෙනි. (4) කුරුවිට බටදොඹ ලෙනෙනි.

05. පළමුවන විජයබාහු රජ සමයේ කරවන ලද පනාකඩුව තඹ සන්නසේ අනුරාධපුරය හැඳින්වීමට යෙදූ ව්‍යවහාර නාමය කුමක් ද?
(1) පුරකමත (2) නුරුපුර
(3) නකර (4) විහාර වාපීගාම

06. ඓතිහාසික මූලාශ්‍රවල විස්තර කර තිබෙන පරිදි මෙරට පාලනය කළ ප්‍රථම රජතුමා හැටියට සැළකෙන්නේ,
(1) විජය රජතුමා ය. (2) දුටුගැමුණු රජතුමා ය.
(3) පණ්ඩුකාභය රජතුමා ය. (4) දේවානම්පියතිස්ස රජතුමා ය.

07. නිශ්ශංකමල්ල රජතුමා සිය සෙල්ලිපිවල තමන්ව හඳුන්වා ගැනීමට භාවිත කළ පදය කුමක් ද?
(1) කාලිංග චක්‍රවර්ති ස්වාමීන් වහන්සේ (2) ආලකමන්දාධිපති
(3) පර්වත රජ (4) නරේශ්වර

08. වසභ රජ සමයේ නාගදීපය පාලනය සඳහා ඎෂිගිරි නම් ඇමතියා පත්කර සිටි බවට සාක්ෂි හමුවනුයේ,
(1) මැදිගිරියේ සෙල්ලිපියෙනි. (2) වල්ලිපුරම් රන්පත් ලේඛනයෙනි.
(3) වෙස්සගිරිය සෙල්ලිපියෙනි. (4) බදුල්ල ටැම් ලිපියෙනි.

09. පොළොන්නරු රජ සමයේ I වන විජයබාහු රජතුමා දළදා මාලිගයේ ආරක්ෂාව සඳහා "වෙලෙක්කාර හමුදාව" යෙදවූ බව සඳහන් වේ. වෙලෙක්කාර යන්නේ තේරුම වනුයේ,
(1) මෙරටට දකුණු ඉන්දියාවෙන් පැමිණි නොමිලේ සේවය කරන ආරක්‍ෂක සේනාවකි.
(2) මෙරටට දකුණු ඉන්දියාවෙන් පැමිණි වැටුපට සේවය කරන ආරක්‍ෂක හමුදාවකි.
(3) යාපනයේ සිට පැමිණි ආරක්‍ෂක හමුදාවකි.
(4) දළදා වහන්සේ භාරව සිටි ස්ථිර හමුදා සේනාංකයකි.

10. අතීත වාරි ශිල්පීන් වැවක සොරොව්වට සම්බන්ධකර තිබූ ගල් කුළුණු ඇත් මැත් කරමින් අවශ්‍ය තරමට ජලය පිටතට මුදා හැරීමට වගබලා ගත්තේය. මෙම කුලුණු හැඳින්වීමට යොදා තිබූ යෙදුම වනුයේ,
(1) රළපනාව ය. (2) දියකැට පහන ය.
(3) බිසෝකොටුව ය. (4) මොහොල ය.

11. පළමුවන පරාක්‍රමබාහු රජුගේ උත්පත්තිය සිහිගන්වනු පිණිස දැදිගම ප්‍රදේශයේ ඉදිකර ඇති චෛත්‍යය කුමක් ද?
(1) මිහින්තල චෛත්‍යය (2) අභයගිරි චෛත්‍යය
(3) දීඝවාපී චෛත්‍යය (4) සුතිඝර චෛත්‍යය

12. පැරණි සමාජය තුළ අය කළ විවිධ බදු වර්ග සම්බන්ධ තොරතුරු සෙල්ලිපිවල ලියා ඇත. ඒ අනුව වැව්වල ජලය භාවිත කරන්නන්ගෙන් අයකළ බද්ද කුමක් ද?
(1) බොජකපති බද්ද (2) මතර මජ්බක බද්ද
(3) දකපති බද්ද (4) මාත්‍රික මතස්‍යභාග බද්ද

13. මෙරට කාන්තාවන් පැරණි සමාජය තුළ වඩාත් ගෞරවාදරයට පත්විය. එසේ විශේෂ ගෞරවාදරයට පත්වීමට හේතුව වනුයේ,
(1) මව්වරුන් ලෙස ඔවුන් ඉසිලූ වගකීම නිසා ය.
(2) රසවත් ආහාරපාන පිළියෙල කිරීමට හැකියාව තිබූ නිසා ය.
(3) සිය ස්වාමියාට ගෞරවාදරය දැක්වීම නිසා ය.
(4) සියුමැලි බවින් යුක්ත වීම නිසා ය.

14. උස් බිම් වල, ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බවට IV වන මිහිඳු රජතුමා නියෝග පනවා තිබූ බව අනුරාධපුර පුවරු ලිපියේ දක්වේ. මෙම නීතිය පැනවීමට හේතුව කුමක් ද?
(1) පාංශු ඛාදනයත් එමගින් නාය යාමත්, ජල උල්පත් සිඳියාමත් සිදුවීම නිසා ය.
(2) කැලෑවල දුවදඬු කපා අධික ලාභ ලැබූ නිසා ය.
(3) මෙරට වනගහනය අඩුවීම නිසා ය.
(4) දුවදඬු රාජ්‍ය දේපලක් ලෙස ආරක්ෂා කළ යුතු නිසා ය.

15. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ ප්‍රධානතම සාධකය වූ කාලිංග මාඝ මෙරට ආක්‍රමණය කරන ලද වර්ෂය කුමක් ද?
(1) ක්‍රි.ව. 1186 (2) ක්‍රි.ව. 1215
(3) ක්‍රි.ව. 1232 (4) ක්‍රි.ව. 1315

16. A - බෙලිගල දළදා මැදුර කරවීම.
B - කාලිංග මාඝ පරාජය කිරීම.
C - චද්‍රභානු නම් ජාවක ආක්‍රමණිකයා පරාජය කිරීම.
D - දඹදෙනිය විජය සුන්දරාරාමය ඉදිකිරීම.
ඉහත සිදුවීම් අතරින් III වන විජයබාහු රජතුමා සම්බන්ධ සිදුවීම් දෙකට අදාළ අක්ෂර තෝරන්න.
(1) B හා D ය. (2) B හා C ය.
(3) A හා D ය. (4) A හා C ය.


17. ගම්පොල රාජධානි සමයේ වීර අලකේශ්වර සෙනවියා සිරකරුවකු ලෙස චීනයට රැගෙන ගියේ චීනයේ පාලනය කළ කුමන අධිරාජ්‍යයාගේ කාලයේ ද?
(1) යුංලෝ (2) චෙන්හෝ
(3) චෙනසිකී (4) යුවංශිකායි

18. උඩරට රාජධානිය ස්වාධීන රාජ්‍යයක් ලෙස ගොඩනගන ලද්දේ,
(1) ජයවීර බණ්ඩාර රජු ය. (2) කරලියද්දේ බණ්ඩාර රජු ය.
(3) සේනා සම්මත වික්‍රමබාහු රජු ය. (4) I වන විමලධර්මසූරිය රජු ය.

19. • ක්‍රි.ව. 1630 දී රන්දෙනිවෙල සටනේදී පෘතුගීසීන් සමූල ඝාතනය කිරීම.
• ක්‍රි.ව. 1638 දී ගන්නොරුව සටනින් පෘතුගීසීන් අන්ත පරාජයට පත් කිරීම.
ඉහත සිදුවීම් දෙකට සම්බන්ධ උඩරට රජකම් කළ රජතුමා කවුද?
(1) දෙවන විමලධර්මසූරිය (2) පළමුවන විමලධර්මසූරිය
(3) දෙවන රාජසිංහ (4) සෙනරත්

20. උඩරට රාජධානි සමයේ රජතුමා විසින්ම විසඳන ලද නඩු වර්ගය කුමක් ද?
(1) දූෂණ හා වංචා නඩු (2) බදු නොගෙවීම සම්බන්ධ නඩු
(3) සොරකම් සම්බන්ධ නඩු (4) කැරලි කෝලාහල පිළිබඳ නඩු

21. නව විද්‍යාත්මක සොයා ගැනීම් යුරෝපයේ පුනරුදයට හේතු සාධක විය. ඒ අනුව ඉහත රූප සටහනේ දක්වෙන විද්‍යාත්මක සොයා ගැනීමක් වන දුරේක්ෂය නිපදවූ තැනැත්තා කවුද?



(1) තෝමස් මුවර්
(2) ගැලීලියෝ ගැලිලි
(3) ප්‍රැන්සිස් බේකන්
(4) නිකලස් කොපර්නිකස්

22. පුනරුද සමයේ සිදුවූ විද්‍යාත්මක සොයා ගැනීම් කීපයක් X තීරුවේ ද, එම සොයා ගැනීමට දායක වූ තැනැත්තන්ගේ නම් Y තීරුවේ ද දක්වේ. X හා Y තීරු නිවැරදිව ගැළපූ විට පිළිතුර තෝරන්න.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. මුද්‍රණ යන්ත්‍රය | A. විලියම් හාවේ |
| 2. රෝග සෑදීමට තුඩුදෙන හේතු ද, ප්‍රතිකර්මද අත්හදා බැලීම. | B. පැරසෙල්සස් |
| 3. මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතියේ තොරතුරු | C. ජොහැන්නස් ගැටන් බර්ග් |
| 4. රුධිරය හදවතේ දකුණු කෝෂයෙන් පිටව ගොස් පෙනහළු මගින් පිරිසිදුව නැවත හදවතට පැමිණ විසිරී යාම. | D. මයිකල් සර්ටෙස් |

(1) C, B, A, D (2) C, B, D, A
(3) A, B, D, C (4) A, C, D, B

23. දේශ ගවේෂණය සඳහා මුලින්ම උනන්දුවක් දක්වූ රාජ්‍ය දෙක වනුයේ,

(1) පෘතුගාලය හා බ්‍රිතාන්‍යයයි. (2) පෘතුගාලය හා ස්පාඤ්ඤයයි
(3) ස්පාඤ්ඤය හා ප්‍රංශයයි. (4) ස්පාඤ්ඤය හා බ්‍රිතාන්‍යයයි.

24. කොන්ස්තන්තිනෝපල් නගරය වර්තමානයේ හැඳින්වෙන නම කුමක් ද?

(1) ලිස්බන් (2) මැඩ්රිඩ්
(3) ඉස්තාන්බුල් (4) ලන්ඩන්

25. ක්‍රි.ව. 1602 දී ලන්දේසි දූතයෙකු ලෙස උඩරට රාජ්‍යයට පැමිණ I වන විමලධර්මසූරිය රජතුමා හමු වූ පුද්ගලයා කවුද?

(1) ෆන් හුත්ස් (2) වෙස්ටර්වල්ඩ්
(3) සීබල් ද වර්ට් (4) ජොරිස් වැන් ස්පිල්බර්ජන්

26. කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට බලපෑ ප්‍රධානතම හේතුව කුමක් ද?


(1) යටත් විජිත පිහිටවා ගත් යුරෝපා රටවල්වල බලය වර්ධනය වීම නිසාය.
(2) යුරෝපයේ වෙළඳාමේ සිදුවූ වර්ධනය නිසා ය.
(3) වෙළඳ භාණ්ඩ සඳහා පැවැති ඉල්ලුම වැඩි වීම නිසාය.
(4) යකඩ හා වානේ, ගල් අඟුරු වැනි සම්පත් යුරෝපයේ බහුල වීම නිසාය.

27. පහත X තීරුවෙන් දක්වෙන්නේ කාර්මික විප්ලව සමයේ සොයාගත් ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුවට ඉවහල් වූ නිර්මාණයන් ය. Y තීරුවේ දක්වෙන්නේ එම නිර්මාණයන් බිහි කිරීමට දායක වූ පුද්ගලයන් ය. X හා Y තීරු නිවැරදිව ගැළපූ විට පිළිතුර වනුයේ,

| | X තීරුව | | Y තීරුව |
|---|---|---|---|
| 1. | මහා මාර්ග තැනීමට යොදාගත් මැකඩම් ක්‍රමය | A. | හෙන්රි බෙල් |
| 2. | වාෂ්ප දුම්රිය එන්ජිම | B. | ජෝන් මැකඩම් |
| 3. | මෝටර් රථය | C. | ජෝර්ජ් ස්ටීවන්සන් |
| 4. | දුම් නැව | D. | ඩෙම්ලර් |

(1) D, B, A, C (2) B, C, A, D
(3) D, C, B, A (4) B, C, D, A

28. ඉහත රූප සටහනේ දක්වෙන්නේ පේෂ කර්මාන්තයේ වර්ධනය සඳහා දායක වූ උපකරණයකි. එම උපකරණයේ නම කුමක් ද?



(1) දුවන නඩාව
(2) ජෙනී යන්ත්‍රය
(3) නූල් කටින යන්ත්‍රය
(4) මියුල් යන්ත්‍රය

29. ක්‍රි.ව. 1762 දී ජෝන් පයිබස් නම් ඉංග්‍රීසි දූතයා ලංකාවට පැමිණෙන විට උඩරට රජකම් කරන ලද්දේ,

(1) රාජාධි රාජසිංහ රජතුමා ය. (2) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය.
(3) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ය. (4) ශ්‍රී විජය රාජසිංහ රජතුමා ය.

30. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ පරිපාලන හා දේශපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආණ්ඩුකාරවරයෙකු පත්කර එවන ලද වර්ෂය කුමක් ද?

(1) ක්‍රි.ව. 1798 (2) ක්‍රි.ව. 1796
(3) ක්‍රි.ව. 1802 (4) ක්‍රි.ව. 1815

11 ශ්‍රේණිය 27.07.2016
ඉතිහාසය

Learning Resource Center
De Mazenod College
Kandana

31. • ඔහු කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ උපාධිධරයෙකි.
• පූජ්‍ය කරතොට ධර්මාරාම හිමි යටතේ සිංහල භාෂාව ඉගෙන ගත්තේ ය.
• ගජමන් නෝනා සමඟ තරගයට කවි ලිවීමට පවා සමත් විය.

ඉහත හැකියා හා දක්ෂතාවලින් පිරිපුන් ඉංග්‍රීසි ජාතිකයා වනුයේ,
(1) රොබට් ඇන්ඩෲස් ය. (2) හියුබොයිඩ් ය.
(3) ජෝන් ඩොයිලි ය. (4) ෆෙඩ්රික් නෝර්ත් ය.

32. A - ගාල්ලේ ලංකෝපකාර මුද්‍රණාලය පිහිටුවීම.
B - පංචමහා වාද මෙහෙය වීම.
C - පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම.
D - ඉන්දියාවේ බුද්ධගයාව රැක ගැනීමට කටයුතු කිරීම.

ඉහත සිදුවීම් ශ්‍රී ලංකාවේ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය හා සම්බන්ධ ඒවාය. ඒ අතරින් පූජ්‍ය බුලත්ගම ධම්මාලංකාර සිරි සුමන තිස්ස හිමි සම්බන්ධ සිදුවීමට අදාළ අක්ෂරය තෝරන්න.
(1) A ය. (2) C ය.
(3) B ය. (4) D ය.

33. මිෂනාරිවරු මෙරට කිතුණු දහම පැතිරවීමට ක්‍රියාකරන විට කොළඹ ප්‍රදේශය භාර වූ මිෂනාරි සමාගම කුමක් ද?
(1) ලන්ඩන් මිෂනාරි සමාගම (2) බැප්ටිස්ට් මිෂනාරි සමාගම
(3) චර්ච් මිෂනාරි සමාගම (4) වෙස්ලියන් මිෂනාරි සමාගම

34. ක්‍රි.ව. 1919 දී ලංකා ජාතික සංගමය පිහිටුවීමට මූලිකවී කටයුතු කළ හින්දු නායකයා වනුයේ,
(1) අරුමුග නාවලර් තුමා ය. (2) ඇම්.සී. සිද්දිලෙබ්බේ මහතා ය.
(3) පොන්නම්බලම් රාමනාදන් මහතා ය. (4) පොන්නම්බලම් අරුණාචලම් මහතා ය.

35. පහත ප්‍රතිසංස්කරණ අතරින් 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලට අයත් නොවන ප්‍රතිසංස්කරණය කුමක් ද?
(1) දිවයින පළාත් 05 කට බෙදීම.
(2) අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.
(3) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.
(4) සර්වජන ඡන්ද බලය ලබාදීම.

36. රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවා එමගින් මෙරට ව්‍යවස්ථාදායක කටයුතු සිදුවූයේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ද?
(1) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය (2) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
(3) මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය (4) කෲව්-මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

37. මෙරට වාමාංශික නායකයින් සිය දේශපාලන උද්ඝෝෂණවල ප්‍රචාරක කටයුතු සඳහා යොදාගත් ව්‍යාපාරය වනුයේ,
(1) පොපිමල් ව්‍යාපාරය යි. (2) සූරිය මල් ව්‍යාපාරය යි.
(3) අමද්‍යප ව්‍යාපාරය යි. (4) මිෂනාරි ව්‍යාපාරය යි.

38. ශ්‍රී ලංකාවේ නාගරික කම්කරු ව්‍යාපාරයට නායකත්වය දෙමින් ලංකා කම්කරු සංගමය පිහිටුවීමට මූලික වූයේ,
(1) පියදාස සිරිසේන මහතා ය. (2) ආතර් වී දියෙස් මහතා ය.
(3) ඒ.ඊ.ගුණසිංහ මහතා ය. (4) නටේසන් අයියර් මහතා ය.

39. 20 වන සියවස මුල් භාගයේ ලංකාවේ රබර් වගාව දියුණු වීමත් සමග රබර් සඳහා පර්යේෂණාගාරයක් පිහිටුවනු ලැබීය. එම පර්යේෂණ ආයතනය පිහිට වූ ස්ථානය කුමක් ද?

(1) අගලවත්ත (2) තලවාකැලේ

(3) ලුණුවිල (4) මාතලේ

40. A - පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ලැබීම.

B - මධ්‍යසාර භාවිතය රටපුරා ව්‍යාප්ත වීම.

C - ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම.

D - අපනයන වැවිලි භෝග හඳුන්වාදීම.

ඉහත සිදුවීම් වලින් බ්‍රිතාන්‍ය යුගයේදී ශ්‍රී ලාංකිකයන්ට උරුම වූ ප්‍රයෝජනවත් අංග 02 ක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) B හා C ය. (2) A හා C ය.

(3) B හා D ය. (4) A හා D ය.

26.07.2016

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2016
## ඉතිහාසය

විභාග අංකය: ........................................................

| 11 ශ්‍රේණිය | II පත්‍රය | කාලය පැය 03 යි. |
| --- | --- | --- |

**උපදෙස්**

- පළමු කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- II කොටසින් ප්‍රශ්න 4 කට ද, III කොටසෙන් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6 කි.

### I කොටස

01. i.(අ) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන ඔබට සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.

(මිනිහාගල් කන්ද, කළුගඟ, යාපනය, සලවත්තොට, මහනුවර, අනුරාධපුරය, කෝට්ටේ, පාහියන්ගල, ගෝකණ්ණතිත්ථ, දඹදෙණිය, තලවාකැලේ, කලා වැව) (ල. 12)

(ආ) සපයා ඇති ලෝක ආකෘති සිතියමේ පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

(ඉතාලිය, කොන්ස්තන්තිනෝපලය, මධ්‍යධරණී මුහුද,මලයාසියාව, පිලිපීන දූපත්, කැලිකට්) (ල. 06)

ii. පහත සඳහන් A හා B රූප සටහන් අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




A රූපය

a. A රූපයේ දක්වෙන්නේ කාර්මික විප්ලව සමයේ ලොවට දායාද වූ යන්ත්‍රයකි. එය හඳුනාගෙන නම් කරන්න.

b. මෙම නිපදවීම නිසා කුමන ක්ෂේත්‍රයක් වර්ධනය වී ද?

c. මෙය නිපදවීමට කටයුතු කළ තැනැත්තාගේ නම කුමක් ද?

d. මෙය නිපදවීම නිසා ලෝක ජනතාවට ලැබුණු ප්‍රයෝජනයක් ලියා දක්වන්න. (ල. 04)



B රූපය

a. B රූප සටහනේ දැක්වෙන රජතුමා කවුද?

b. එතුමා කුමන රාජ්‍ය සමයක රජකම් කරන ලද්දේ ද?

c. එතුමා රජවීමට පෙර හඳුන්වන ලද නම කුමක් ද?

d. මෙම රජතුමා විසින් මෙහෙයවන ලද පෘතුගීසි විරෝධී සටනක නමක් ලියා දක්වන්න. (ල. 04)

iii. පහත සඳහන් A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු ආශ්‍රිත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

A - මෙරට සාසන ඉතිහාසය පිළිබඳ තොරතුරු ලියවී ඇති කෘතිය කුමක් ද?

B - පුනරුද සමයේ රෝමයේ සිස්ටයින් දේවස්ථානයේ සිවිලිමේ සිතුවම් නිම කරන ලද කලාකරුවාගේ නම කුමක් ද?

C - පළමුවරට මෙරට විශාල ප්‍රමාණයේ වැව් ඉදි කිරීමට පුරෝගාමී වූ රජතුමා කවුද?

D - කිසිම සතෙකු නොමැරිය යුතු බවට අමණ්ඩ ගාමිණී අභය රජතුමා විසින් පනවන ලද නීතිය කුමක් ද? (ල. 04)

## II කොටස

02\. i. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ බවට විශ්වාස කරන සාක්ෂි හමු වූ

A - වෙරළාශ්‍රිත එළිමහන් කඳවුරක්

B - පහතරට තෙත් කලාපීය ලෙනක්

C - කඳුකර එළිමහන් දඩයම් ස්ථානයක්

වරහන් තුළින් තෝරා A, B, C අනුපිළිවෙළින් ලියා දක්වන්න.

(පාහියන්ගල, හෝර්ටන්තැන්න, අලිගල, මිනිහාගල් කන්ද) (ල. 03)

ii. ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාර වශයෙන් භාවිත කරන ලද

A - ශාකමය ආහාර වර්ග 2 ක්ද

B - සත්ත්වමය ආහාර වර්ග 02 ක්ද ලියා දක්වන්න. (ල. 04)

iii. පූර්ව ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයාගේ ජීවන රටාව හා තාක්ෂණය කරුණු 02 ක් යටතේ විස්තර කරන්න. (ල. 05)

iv. මුල් ඓතිහාසික යුගයේ යැපීම් ක්‍රමය, ජනාවාසවල ස්වභාවය කරුණු 03 ක් යටතේ විස්තර කරන්න. (ල. 06)

03. i. මෙරට වියළි කලාපීය පැරණි නගර පරිහානියට පත් වීමට බලපෑ හේතු 03 ක් ලියන්න. (ල. 03)

ii. පහත සඳහන් P, Q, R, S යටතේ දක්වා ඇති තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන් දැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියන්න.

P - ජාතක කථා පොත සිංහලයට පරිවර්තනය කිරීම.

Q - සපුමල් කුමාරයා යටතේ හමුදාව යවා යාපනය ජය ගැනීම.

R - කාලිංස මාඝ පරාජය කිරීම.

S - ඊජිප්තුවේ සුල්තාන් වෙත තානාපතිවරු පිරිසක් යවා වෙළඳ සම්බන්ධතා පුළුල් කර ගැනීම.

(I වන බුවනෙකබාහු රජතුමා, IV වන පරාක්‍රමබාහු රජතුමා, VI වන පරාක්‍රමබාහු රජතුමා, II පරාක්‍රමබාහු රජතුමා, I වන පරාක්‍රමබාහු රජතුමා) (ල. 04)

iii. රජරට ශිෂ්ටාචාර බිඳ වැටීමෙන් පසු මෙරට ආර්ථික රටාවේ සිදු වූ වෙනස්කම් කරුණු 02 ක් යටතේ විස්තර කරන්න. (ල. 05)

iv. දෙවන නාගරීකරණ සමයේ මෙරට

A - ආගම්වල ස්වභාවය

B - කලාව හා ගෘහ නිර්මාණ කලාව

යන ක්ෂේත්‍රවල දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ එක බැගින් දක්වමින් විස්තර කරන්න. (ල. 06)

04. i. මහනුවර රාජධානිය හඳුන්වා තිබූ තවත් නම් 03 ක් සඳහන් කරන්න. (ල. 03)

ii. පහත සඳහන් සිදුවීම් හා ඊට සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙළින් නම් කරන්න.

A - පළමුවන විමලධර්මසූරිය නමින් උඩරට රජවීම.

B - ක්‍රි.ව. 1753 දී සියම් දේශයෙන් භික්ෂූන් ගෙන්වා මෙරට උපසම්පදාව පිහිටුවීම.

C - 1815 මාර්තු 02 දින ඉංග්‍රීසින් විසින් වෙල්ලෝරයට පිටමං කළ රජු

D - උඩරට රාජධානිය ස්වාධීන රාජ්‍යයක් ලෙස පළමුවෙන්ම ගොඩනැගූ රජු (ල. 04)

iii. පළමුවන විමලධර්මසූරිය රජතුමා උඩරට රාජ්‍ය සමයේ සිටි ශ්‍රේෂ්ඨ පාලකයෙකි. එතුමාගේ ආර්ථික හා ආගමික සේවාව කරුණු 02 ක් යටතේ විස්තර කරන්න. (ල. 05)

iv. මහනුවර රාජධානි සමයේ සමාජ සංවිධානය කරුණු 03 ක් යටතේ විස්තර කරන්න. (ල. 06)

05. i. පහත දැක්වෙන සිද්ධීන් සම්බන්ධ පුද්ගලයන් A, B, C අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - බ්‍රිතාන්‍යයන් උඩරට යටත් කරගත් අවධියේ පහතරට පාලනය කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා

B - 1815 මාර්තු 2 දින බ්‍රිතාන්‍යයන් එස වූ ඉංග්‍රීසි කොඩිය බිම දමා සිංහ කොඩිය එසවූ ස්වාමීන් වහන්සේ

C - 1848 දෙවන නිදහස් සටනට බලපෑමක් ඇති වූ නව බදු පැන වූ ඉංග්‍රීසිආණ්ඩුකාරවරයා (ල. 03)

ii. ශ්‍රී ලංකාව අත්පත් කර ගැනීම කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමු වීමට හේතු වූ කරුණු 02 ක් සඳහන් කරන්න. (ල. 04)

iii. 1818 පළමු නිදහස් සටනට හේතු වූ කරුණු 02 ක් විස්තර කරන්න. (ල. 05)

iv. A ක්‍රි.ව 1850 පසුව මෙරට ඇතිවූ ආගමික හා ජාතික පුනරුද ව්‍යාපාරයේ

- බෞද්ධාගමික පුනර්ජීවනයට නායකත්වය දුන් හිමි නමක් ද
- ඉස්ලාම් ආගමික පුනර්ජීවනයට නායකත්වය දුන් පුද්ගලයකු ද
- හින්දු ආගමික පුනර්ජීවනය යටතේ "උදයභාණු" නම් පුවත්පතක් ආරම්භ කළ තැනැත්තාද පිළිවෙළින් නම් කරන්න.

B ඔබ නම් කළ එක් තැනැත්තෙකුගෙන් ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයට සිදු වූ සේවාව නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ල. 06)

06. i. පහත දැක්වෙන කරුණු හා සම්බන්ධ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය නම් කරන්න.

A - වයස අවු. 21 වැඩි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම සර්ව ජන ඡන්ද බලය ප්‍රදානය කිරීම.

B - ව්‍යවස්ථාදායක සභාවට ප්‍රථම වරට ඡන්ද බලයෙන් නියෝජිතයන් පත් කිරීම.

C - මුළු දිවයිනම පළාත් 05 කට බෙදීම. (ල. 03)

ii.



A රූපය



B රූපය

ඉහත A හා B රූප සටහන් දෙකේ දක්වෙන්නේ මෙරට වාමාංශික දේශපාලන ව්‍යාපාරයේ නායකයන් දෙදෙනෙකු ය. ඔවුන් දෙදෙනාගේ නම් A හා B අනුපිළිවෙළින් නම් කරන්න. (ල. 04)

iii. 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ හඳුන්වා දුන් දේශපාලන හා ආර්ථික වෙනස්කම් 02 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

iii. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය තුළින් ශ්‍රී ලාංකිකයන්ට ලැබුණු බලතල 02 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

07. i. පහත සඳහන් වැව් ඉදිකිරීම සඳහා දායක වූ රජවරුන්ගේ නම් A, B, C අනුපිළිවෙළින් ලියන්න.

A - තිසා වැව

B - මින්නේරිය වැව

C - කලා වැව (ල. 03)

ii. පැරණි කාලයේ අවකාශය (පරිමාව) මැනීම සඳහා යොදාගත් මිම් දෙකක් සඳහන් කරන්න. (ල. 04)

iii. පැරණි වාස්තු විද්‍යාවේ ස්වභාවය පැරණි විශිෂ්ට නිර්මාණ 02 ආශ්‍රයෙන් විස්තර කරන්න. (ල. 05)

26.07.2016 II

iv. අපේ පැරණි වාරි තාක්ෂණයේ විශිෂ්ටත්වය

A - වැවක අංගයක් ආශ්‍රයෙන් හා

B - ඇළ මාර්ගවල ස්වභාවය ආශ්‍රයෙන් විස්තර කරන්න. (ල. 06)

Learning Resource Center R De Mazenod College Kandana

## III කොටස

08. ක්‍රි.ව 14 වන සියවසේ සිට 16 වන සියවස දක්වා යුරෝපයේ ආර්ථික, කලාත්මක, විද්‍යාත්මක ක්ෂේත්‍රවල ඇති වූ පුළුල් පරිවර්තනය පුනරුදය ලෙස හැඳින්වේ.

i. පහත දැක්වෙන නිර්මාණය සහ සොයාගැනීම් වලට දායක වූ තැනැත්තා වරහන් තුළින් තෝරා A, B, C අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - ක්‍රිස්තුස් වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය චිත්‍රය නිර්මාණය

B - ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම.

C - අප්‍රිකාවේ දකුණු තුඩුව (සුබ පැතීමේ තුඩුව) සොයා ගැනීම.

(අයිසැක් නිව්ටන්, ගැලීලියෝ ගැලිලි, ලියනාඩෝ ඩාවින්චි, මයිකල් ඇන්ජලෝ, ක්‍රිස්ටෝපර් කොලොම්බස්, බර්තොල මියුඩයස්) (ල. 03)

ii. පුනරුදය ඇති වීමට බලපෑ හේතු 02 ක් ලියා දක්වන්න. (ල. 04)

iii. නව මුහුදු ගමන් සෙවීමට (දේශගවේෂණය) හේතු සාධක වූ කරුණු 02 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

iv. පුනරුදය ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කළ බලපෑම කරුණු 03 ක් යටතේ නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 06)

09. i. කාර්මික විප්ලවය ආරම්භ වූ ක්ෂේත්‍ර 03 ක් නම් කරන්න. (ල. 03)

ii. කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයේ ආරම්භ වීමට බලපෑ හේතු 02 ක් ලියන්න. (ල. 04)

iii. පහත දැක්වෙන ක්ෂේත්‍ර කාර්මික විප්ලවයට දායක වූ අයුරු උදාහරණ 02 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

A - ප්‍රවාහන ක්ෂේත්‍රය

B - සන්නිවේදන ක්ෂේත්‍රය (ල. 05)

iv. කාර්මික විප්ලවය තුළින් සමාජ ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)